# රජයේ මුද්‍රණාලයට බාහිර අය බඳවා ගත්තේ කුමන පදනමකින්ද?

## පැෆරල් සංවිධානය විමසයි

(ආරියරත්න රණබාහු)

ජනාධිපතිවරණ ඡන්ද පත්‍රිකා රාජ්‍ය මුද්‍රණාලයේ මුද්‍රණය වන මෙම අවස්ථාවේ එහි ආරක්ෂාවට සාමාන්‍යයෙන් යොදවා සිටි පිරිස් ඉවත් කර පොලීසියේ පිරිසක් එහි යෙදවීම සම්බන්ධයෙන් හා එහි රහස්‍ය අංශයට බාහිර පිරිසක් බඳවාගැනීම පිළිබඳව මාධ්‍ය වාර්තා මගින් මතුකර ඇති කරුණු පිළිබඳව විමසා පැෆරල් සංවිධානය රජයේ මුද්‍රණාලයාධිපතිවරයා වෙත ලිපියක් යවා තිබේ.

නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය (පැෆරල්) සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා යවා ඇති එම ලිපිය මගින් කරුණු කීපයක් පිළිබඳව විමසා ඇති අතර ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන ලෙස ඉල්ලා ඇත.

රජයේ මුද්‍රණාලයේ රහස් අංශයට බාහිරින් පිරිසක් පත් කර තිබේද යන්නත් එසේ නම් එය කළේ කුමන පදනමක් යටතේද යන්නත් එම අංශය වෙනුවෙන් සාමාන්‍යයෙන් ලබාදෙන නිලධාරීන් ඉවත් කර පොලිස් නිලධාරීන් පත් කළේද යන්නත් එසේ සිදුකළේ නම් එයට සුවිශේෂ වූ කරුණු කවරේද යන්නත් පිළිබඳව පැෆරල් විධායක අධ්‍යක්ෂවරයා මැතිවරණ කොමසාරිස්වරයාගෙන් විමසා ඇත.

රජයේ මුද්‍රණාලයාධිපති හා එහි කාර්යමණ්ඩලය පිළිබඳව පූර්ණ විශ්වාසය තබන බවත් ජනාධිපතිවරණයේ ඡන්ද පත්‍රිකා මුද්‍රණය හා සම්බන්ධව ඊට අදාළව ජනතා මතය හා එහි ඇති බැරෑරුම්කම සැලකිල්ලට ගෙන මෙම ලිපියේ අන්තර්ගත කරුණු මෙසේ ඉදිරිපත් කරන බවත් පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂවරයා එම ලිපියේ වැඩිදුරටත් සඳහන් කර ඇත.